# ශ්‍රී ලංකාවේ සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන් (එල්ජීබීටීඅයි ප්‍රජාවන්) කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ මාර්ගෝපදේශය


Women and Media Collective
Established 1984

Norwegian Embassy
*Colombo*

# හැඳින්වීම

මෙම මාර්ගෝපදේශය මඟින් වර්තමානයේ ශ්‍රී ලාංකික සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන් කෙරෙහි බලපාන ප්‍රධාන ගැටලු පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයනු ඇත.

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සහ විශේෂයෙන් කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධීක්ෂණ කමිටු අංශයේ සාමාජිකයින් වෙනුවෙන් භාවිත කළ හැකි සම්පතක් ලෙස මෙම මාර්ගෝපදේශය නිර්මාණය කර ඇත.

මෙම මාර්ගෝපදේශයෙන් අවධාරණය කර ඇති කරුණු සමීපව අධ්‍යයනය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තම කාලය වෙන් කරනු ඇතැයි ද, එම ප්‍රජාවන් මුහුණ දෙන ගැටළු තේරුම් ගෙන අනාගතයේ දී ශ්‍රී ලාංකික එල්ජීබීටීඅයි ප්‍රජාවන් සමඟ සම්බන්ධ වීමට සහ ඔවුන්ගේ අයිතීන් වෙනුවෙන් අධිවාචනය කිරීමට ඔවුන් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරනු ඇත.

සැලකිලිමත් විය යුතු අංශ අනුව, මෙම මාර්ගෝපදේශය පහත ආකාරයට වෙන් කර ඇත. මෙම සෑම අංශයක් යටතේ ම, ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය, අදාළ දේශීය හා ජාත්‍යන්තර වර්ධනයන් සහ මන්ත්‍රීවරුන් සඳහා වන නිර්දේශයන් පිළිබඳ විස්තරයක් සපයා ඇත.

A. සමලිංගික හැසිරීම අපරාධීකරණය කිරීම
B. විවිධ ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාවන් පාලනය කිරීම
C. වෙනස් කොට සැලකීමකින් තොර වීම සහතික කිරීමට ක්‍රියා මාර්ග නොමැතිකම
D. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීම
E. සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම
F. ලිංගිකත්වය වෙනස් කිරීම සඳහා සිදු කරන පරිවර්තන චිකිත්සාව

## නිර්වචනය

මෙම ලේඛනයේ ශ්‍රී ලංකාවේ සමරිසි, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික හෙවත් එල්ජීබීටීඅයි ප්‍රජාව සම්බන්දයෙන් කරුණු පවතී. පහත දැක්වෙන නිර්වචන ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ ඇමරිකානු මනෝ විද්‍යාවේදීන්ගේ සංගමය (APA) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුව පරිවර්තනය කර ඇත.

***ලිංගික දිශානතිය*** යනු පුද්ගලයෙකුගේ ශාරීරික හා රෝමාන්තිකව (ප්‍රේමනීය) ආකර්ෂණය වෙනත් පුද්ගලයින් කෙරෙහි යොමු වීමයි. එසේම කෙනෙකුගේ ලිංගික දිශානතිය එම පුද්ගලයාගේ ලිංගික ආකර්ෂණය, ලිංගික හැසිරීම සහ ලිංගික අනන්‍යතාවයන්ගෙන් සමන්විත වේ.

**සමරිසි කාන්තාව** : ලිංගිකව හා රෝමාන්තිකව වෙනත් කාන්තාවක් වෙත ආකර්ෂණය වන කාන්තාව

**සමරිසි පුරුෂයා** : ලිංගිකව හා රෝමාන්තිකව වෙනත් පුරුෂයෙකුට ආකර්ෂණය වන පුරුෂයා

**ද්වීරිසි පුද්ගලයා** : ලිංගිකව හා රෝමාන්තිකව තමන් හා සමාන හෝ ප්‍රතිවිරුද්ධ ලිංගයට සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවයන්ට අයත් වන පුද්ගලයන්ට ආකර්ෂණය වන පුද්ගලයෙක්.

(ඉහත සඳහන් ලිංගික අනන්‍යතාවයන් විෂම ලිංගික අනන්‍යතාවය මත සසඳා ඇත.: මූලික වශයෙන් ලිංගිකව හා රෝමාන්තිකව විරුද්ධ ලිංගයේ පුද්ගලයන් වෙත ආකර්ෂණය වන පුද්ගලයන්)

පුද්ගලයෙකුට තමා පිරිමි, ගැහැණු හෝ වෙනත් ලිංගයකට අයත් පුද්ගලයෙකු ලෙස අභ්‍යන්තරව හැඟීම/දැනීම **ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව** ලෙස හඳුන්වයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය උපතේදී පවරා ඇති හෝ අනුමාන කරන ලද ලිංගයට සමාන හෝ අසමාන විය හැකිය.

**සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්** : තමන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අභ්‍යන්තර හැඟීම (තමන්ට දැනීම) උපතේදී ඔවුන්ට හිමි වූ ස්ත්‍රී පුරුෂ භාවයට වඩා වෙනස් ලෙස හැඟෙන/දැනෙන පුද්ගලයන් මෙනමින් හඳුන්වයි. උදා. සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රියක් තමා කාන්තාවක් ලෙස හඳුනාගන්නා නමුත් එම පුද්ගලයා උපත ලබන විට සතු වූ ලිංගික අවයවය මත පදනම්ව පිරිමියෙකු ලෙස හඳුන්වයි. සංක්‍රාන්ති සමාජභාවී පිරිමියෙකු තමා පිරිමියෙකු ලෙස හඳුනාගන්නා නමුත් එම පුද්ගලයා උපත ලබන විට සතු වූ ලිංගික අවයවය මත පදනම්ව කාන්තාවක් ලෙස හඳුන්වයි.

**අන්තර් ලිංගික පුද්ගලයන්** : පිරිමි හෝ ගැහැණු යන සාම්ප්‍රදායික නිර්වචනවලට නොගැළපෙන භෞතික හෝ ජීව විද්‍යාත්මක ලිංගික ලක්ෂණ සහිතව (ලිංගික ව්‍යුහය , ප්‍රජනක අවයව සහ / හෝ වර්ණදේහ රටා ඇතුළුව) උපත ලැබූ පුද්ගලයින් මෙනමින් හඳුන්වයි. මෙම ලක්ෂණ ඇතැම්විට උපතේ දී දැකිය හැකි වන අතර ඇතැම්විට ජීවිතයේ පසුකාලීනව මතුවිය හැකි ය.

(ඉහත සඳහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් සිස්ජෙන්ඩර් අනන්‍යතාවය මත සසඳා ඇත : උපතින්ම පවරා ඇති ස්ත්‍රී පුරුෂ භාවයට සමාන ස්වකීය ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අභ්‍යන්තර හැඟීමක් ඇති පුද්ගලයින් මෙයින් අදහස් කරයි. උදා. සිස්ජෙන්ඩර් පිරිමියෙකු තමා පිරිමියෙකු ලෙස හඳුනාගන්නා අතර එම පුද්ගලයා උපත ලබන විට සතු වූ ලිංගික අවයවය මත පදනම්ව පිරිමියෙකු ලෙස හඳුන්වයි.)

## A. සමලිංගික හැසිරීම අපරාධීකරණය කිරීම

**ගැටලුව :** දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 (ආ) වගන්ති මඟින් ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් අතර සම්මුතිවාදී සමලිංගික ලිංගික හැසිරීම අඛණ්ඩව අපරාධීකරණය කිරීම.

- දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තියට අනුව "අස්වාභාවික ලිංගික සංසර්ගය" අපරාධයක් ලෙස නම් කර ඇත. එය එකම ලිංගයේ පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවන ලිංගික ක්‍රියාවන්ට පමණක් අදාළ වන බවට වැටහීමක් ඇත. මෙය උල්ලංඝනය කළහොත් වසර දහයක් දක්වා සිර දඬුවමක් හා දඩයක් දඬුවම වශයෙන් ලැබිය හැක.
- දණ්ඩ නීති සංග්‍රහයේ 365 (අ) වගන්තියට අනුව "වෙනත් පුද්ගලයෙකු සමඟ අස්වාභාවික ලෙස කටයුතු කිරීම" අපරාධයක් ලෙස නම් කර ඇත. "අස්වාභාවික" යන වචනය ශ්‍රී ලංකා නීති හෝ උසාවි මඟින් නිර්වචනය කර නැතත්, එය එකම ලිංගයේ පුද්ගලයන් දෙදෙනෙකු අතර ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ කරන ලිංගික ක්‍රියාවන් සහ ප්‍රේම සම්බන්ධතා ඉලක්ක කරන බවට වැටහීමක් ඇත. මෙය උල්ලංඝනය කළහොත් වසර දෙකක සිර දඬුවමක් හා දඩයක් දඬුවම වශයෙන් ලැබිය හැක.
- දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 (අ) වගන්ති 1883 දී බ්‍රිතාන්‍යය විසින් එම නීති ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් අවස්ථාවේ දී මෙන් ම තවමත් භාවිතයේ පවතී. 365 (අ) වගන්තිය 1995 දී සංශෝධනය කළ අතර එහිදී "පිරිමින්" කියන වචනය "පුද්ගලයන්" ලෙස වෙනස් කල අතර එමගින් එකම ලිංගයේ දෙදෙනෙකු සිදුකරන ලිංගික ක්‍රියාවන් නීති විරෝධී කරන ලදි.

**වර්තමාන තත්ත්වය :**

- 1948 සිට 365 සහ 365 (අ) වගන්ති යටතේ වාර්තා ගත වූ වරදකරුවන් වී ඇති පුද්ගලයන් ගණන ඉතා අල්ප ය. කෙසේවෙතත්, එම නීති වක්‍රාකාරව එල්ජීබීටීඅයි පුද්ගලයින් වෙත වෙනස්කොට සැලකීම්, හිරිහැර කිරීම් සහ ප්‍රචණ්ඩත්වයන් සිදුවීම සඳහා බලපෑම් ඇති කරනු ලබයි.
- එල්ජීබීටීඅයි ප්‍රජාවේ පුද්ගලයින්ට හිරිහැර කිරීම, ශාරීරිකව හෝ ලිංගික අතවර කිරීම හෝ ඔවුන්ගෙන් අල්ලස් ඉල්ලා සිටීම සඳහා පොලිස් නිලධාරීන් මෙම නීති යටතේ නඩු පැවරන බවට සිදු කරන තර්ජන භාවිත කර ඇත. මෙම නීතිවල පැවැත්ම නිසා අපරාධවලට ගොදුරු වූ එල්ජීබීටීඅයි ප්‍රජාවේ පුද්ගලයන් පොලීසියෙන් සිදුවන වෙනස් කොට සැලකීම, හිරිහැර කිරීම සහ ප්‍රචණ්ඩත්වය අත්විඳිනු ඇතැයි යන බිය නිසා තමාට සිදුවන අපරාධ පොලිසියට වාර්තා කිරීමට අකමැති වේ.
- එල්ජීබීටීඅයි පුද්ගලයින් බොහෝ විට 365 සහ 365 ඒ වගන්ති යටතේ අත්අඩංගුවට ගනු ලැබේ. 365 සහ 365 ඒ වගන්ති යටතේ නඩු පැවරීමේදී දිගු කාලයක් ගතවන බැවින් පාදඩ ආඥා පනත යටතේ නඩු පවරනු ලැබේ. මේ අනුව 365 සහ 365 ඒ වගන්ති යටතේ වාර්තා වී ඇති වරදකරුවන්ගේ අනුපාතය අඩු වුවද, නීතියෙන් පීඩා විඳි මුළු එල්ජීබීටීඅයි පුද්ගලයින්ගේ සංඛ්‍යාව මින් අවධාරණය නොකරයි.
- සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධීකරණය කිරීම නිසා, එල්ජීබීටීඅයි පුද්ගලයන්ට සමාජයෙන් මෙන්ම විශේෂයෙන් ඔවුන්ගේ පවුල්, අධ්‍යාපන ආයතන, සේවා ස්ථාන සහ රාජ්‍ය ආයතන වෙතින් ද වෙනස් කොට සැලකීම්, හිරිහැර හා ප්‍රචණ්ඩත්වයන් අත්විඳීමට සිදු වී ඇත.
- වැඩිහිටියන් අතර ඔවුනොවුන්ගේ එකඟතාවයෙන් යුක්තව සිදුවෙන සමලිංගික හැසිරීම සම්බන්ධයෙන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා පසුගිය වසර කිහිපය තුළ පොලීසිය විසින් හෝටල් සහ වෙනත් ස්ථාන වටලා තිබේ. පොලිස් කාර්ය සාධන වාර්තා වලට අනුව පොලිසිය විසින් සම ලිංගික සේවනයේ යෙදෙන පුද්ගලයන් නිරතුරුව අත්අඩංගුවට ගෙන ඇති බව පෙන්වා දෙයි. අත්අඩංගුවට ගත් පසු එම පුද්ගලයින් වයර්වලින් පහර දීම වැනි අතවරයන්ට මුහුණ දී තිබේ. මෙසේ අත් අඩංගුවට ගෙන නඩු පැවරූ අවස්ථා ගණනාවකදී, නඩු පැවරූ පුද්ගලයින්ට ඔවුන්ගේ අවසරයකින් තොරව එච්.අයි.වී පරීක්ෂාවට ලක් කරන ලෙස අධිකරණය නියෝග කර ඇති අතර, එහි ප්‍රතිපල අධිකරණයේ ප්‍රසිද්ධ කර ඇත.
- "සමලිංගික හැසිරීම පිළිබඳ සාක්ෂි සැපයීමේ උත්සාහයක් ලෙස" 2017 සිට බලහත්කාරයෙන් ගුද හා යෝනි පරීක්ෂාවන්ට යටත් කරන ලෙස නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් නියෝග දී ඇති බව මෑත කාලීන මාධ්‍ය වාර්තා මගින් හෙළි කර තිබේ. එවැනි බලහත්කාර පරීක්ෂාවන් නිසාවෙන් එම පරීක්ෂාවන්ට ලක්වන පුද්ගලයා හට ලිංගික හිංසනය මෙන්ම කුරිරු, අමානුෂික හා පහත් ලෙස

සැලකීමක් වන අතර ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජාත්‍යන්තර නීතිමය විධි විධාන යටතේ තහනම් කර ඇත. මෙම නඩු බොහොමයකදී, එවැනි බලහත්කාර පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කළ හැකි බව වින්තිකරුවන් දැන සිටියේ නැත.

**දේශීය වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- 2016 දී විමලසිරි එදිරිව මරදාන පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සහ නීතිපති නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය කියා සිටියේ ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 365 වන වගන්තිය යටතේ "අශෝබන ලෙස හැසිරීම" නීතියේ කොටසක් ලෙස පැවතුනද එකිනෙකාගේ කැමැත්තෙන් වැඩිහිටියන් දෙදෙනෙකු අතර සිදුවන ලිංගික ක්‍රියාවන් රජය විසින් සෙවීම/පාලනය නවතා දැමිය යුතු බව සහ මෙම නීතිය වසර ගණනාවක් තිස්සේ පැවතියද එය තාර්කික විය හැකි නිසා එයට නීතියෙන් දඬුවම් දීම නුසුදුසු ලෙසටය.

- ශ්‍රී ලංකාවේ අපරාධ නීති යාවත්කාලීන කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීම සඳහා "දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමේ විශේෂ කමිටුව" 2016 දී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අලුවිහාරේ එම කමිටුවේ ප්‍රධානීත්වය සහිත ව පත් කරන ලදී. පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති ව්‍යවස්ථාදායක නිර්දේශ වට කිහිපයක් මේ වනවිට එහි ඇතුළත් කර ඇත. එම කමිටුව දැනට දණ්ඩ නීති සංග්‍රහයේ 365, 365 (අ) සහ 399 වගන්ති පිළිබඳ සලකා බලයි.

**ජාත්‍යන්තර වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- 2012 දී ශ්‍රී ලංකාව සඳහා වූ දෙවන විශ්ව ආවර්තක සමාලෝචනයේදී (යූපීආර්) රටවල් දෙකක් (කැනඩාව, ආර්ජන්ටිනාව) වැඩිහිටියන් අතර සමලිංගික හැසිරීම නිර්සාපරධීකරණය කළ යුතු බවට ශ්‍රී ලංකාව වෙත නිර්දේශ කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකාව විසින් එම නිර්දේශ 'සටහන්' කර ගත් බව සඳහන් කරන ලදී.
- 2017 දී ශ්‍රී ලංකාව සඳහා වන තුන්වන විශ්ව ආවර්තක සමාලෝචනයේ දී (ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, බ්‍රසීලය, කැනඩාව, ස්වීඩනය, උරුගුවේ, හොන්ඩුරාස්) රටවල් හයක් වැඩිහිටියන් අතර සමලිංගික හැසිරීම නිර්සාපරධීකරණය කළ යුතු බවට ශ්‍රී ලංකාව වෙත නිර්දේශ කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් ද ශ්‍රී ලංකාව විසින් එම නිර්දේශ 'සටහන්' කර ගත් බව සඳහන් කරන ලදී.
- 2017 දී ශ්‍රී ලංකාව සඳහා වන තුන්වන තුන්වන විශ්ව ආවර්තක සමාලෝචනයේ දී ශ්‍රී ලංකාව නිල වශයෙන් ප්‍රකාශ කළේ "නීති සංග්‍රහයේ අඩංගු සියලුම වගන්ති ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීමට කැපවී සිටින" බවත්
"එල්ජීබීටීඅයි ප්‍රජාවේ පුද්ගලයන්ට වෙනස් ලෙස සැලකීම සඳහා නීතියේ කිසිඳු විධිවිධානයක් ක්‍රියාත්මක නොවන බවට සහතික වීමට කැපවී සිටින බවත් ය."
- 2017 දී එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියේ "වැඩිහිටියන් දෙදෙනෙකු අතර කැමැත්තෙන් සිදුවන සමලිංගික ක්‍රියාවන් නිර්සාපරාධීකරණය කිරීමේ අරමුණින් දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන ලෙසයි."
- 2018 දී ඉන්දියාව, 2019 දී බොට්ස්වානා සහ ඇන්ගෝලාව, 2020 දී භූතානය ද ඇතුළුව ලොව පුරා රටවල් ගණනක් සමලිංගික හැසිරීම් නිර්සාපරාධීකරණය කිරීමට පියවර ගෙන තිබේ.

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ :**

- දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 (අ) වගන්ති අවලංගු කිරීම සඳහා ව්‍යවස්ථාදායක යෝජනා හඳුන්වා දීම සහ සහාය දීම.
- ව්‍යවස්ථා සංශෝධනයට අනුව එල්ජීබීටීඅයි ප්‍රජාවන්ට අදාළ නොවන ලෙස දණ්ඩ නීති සංග්‍රහය සහ පාදඩ ආඥා පනත නිවැරදිව අර්ථ නිරූපණය කිරීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා රාජ්‍ය බලධාරීන්, විශේෂයෙන් පොලීසිය දිරිමත් කිරීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින්ට පොලිස් ස්ථානවලදී සහ වෙනත් ස්ථානවලදී සමාන ලෙස හා සාධාරණ ලෙස සැලකීම සඳහා පොලීසියට මාර්ගෝපදේශ නිකුත් කිරීමට දිරිමත් කිරීම.

## B. විවිධ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවන් පාලනය කිරීම

**ගැටලුව :** දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය සහ පාදඩ ආඥා පනතේ 7 වන වගන්තිය හරහා සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන්ව අඛණ්ඩව පාලනය කිරීම.

- දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය යටතේ "වෙනත් පුද්ගලයෙකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම" සාපරාධී වරදකි. මෙම උල්ලංඝනය කිරීම සඳහා වන දඬුවම වසරක සිර දඬුවමක් සහ/හෝ දඩයකි.
- පාදඩ ආඥා පනතේ 7 වන වගන්තිය මඟින් අශෝභන ක්‍රියාවන් කිරීමට උත්සහ කිරීම හෝ කිරීම තහනම් මෙන්ම පොදු ස්ථානයක වැරදි සහගත වංචනිකයන් ලෙස නීති විරෝධී හෝ අස්වාභාවික සංසර්ගයන් ප්‍රසම්පාදනය කිරීම  තහනම් කරයි. මෙය උල්ලංඝනය කිරීම සඳහා වන දඬුවම මාස හයක සිර දඬුවමක් සහ/හෝ දඩයකි.
- දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය සහ පාදඩ ආඥා පනත පිළිවෙලින් 1883 සහ 1841 දී බ්‍රිතාන්‍යය විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් අවස්ථාවේ දී පැවති ලෙස ම තවමත්  පවතී.

**වර්තමාන තත්ත්වය :**

- දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය වැරදි ලෙස අර්ථ නිරූපණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ඔවුන්ට කැමති ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ප්‍රකාශ කිරීම නිසා ඔවුන්ගේ සැබෑ අනන්‍යතාවය සැඟවීම සහ මහජනතාව හිතාමතාම නොමඟ යැවීම සිදු කෙරෙන බව අදහස් වීමෙන් එය ඔවුන්ට වැරදි ලෙස අදාළ වේ.
- සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන්ට පාදඩ ආඥා පනත වැරදියට අදාළ වන්නේ ඔවුන්ගේ පෙනුම මත පදනම්ව සාපරාධී ක්‍රියාවන්හි යෙදීමට උත්සාහ කරන බවට උපකල්පනය කර ඇති බැවිනි. එය විශේෂයෙන් භාවිත කරනුයේ සංක්‍රාන්ති සමාජභාවී සහ හරස් විලාසිනි  ලිංගික ශ්‍රමිකයින්ට එරෙහිව ය.
- මෙම අවස්ථා දෙකෙහිම, සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය සාපරාධී යැයි අනුමාන කෙරේ. (ඔවුන් කිසිදු සාපරාධී කටයුත්තක නිරත නොවුණ ද)
- වාර්තාගත වී ඇති ආකාරයට 1948 සිට 399 වගන්තිය සහ පාදඩ ආඥා පනත යටතේ පුද්ගලයන් වරදකරුවන් වී ඇත්තේ ඉතා අල්ප වශයෙනි. කෙසේවෙතත් මේ නිසා වක්‍රාකාරව සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයන්ට බොහෝ වෙනස්කම් කිරීම්, හිරිහැර හා ප්‍රචණ්ඩත්වයන්ට මුහුණ පෑමට සිදු වේ.
- පොලිස් නිලධාරීන් විසින් ශ්‍රී ලාංකික සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට ශාරීරිකව හෝ ලිංගික අතවර කිරීමටත් ඔවුන්ගෙන් අල්ලස් ලබා ගැනීමටත් මෙම නීති යටතේ නඩු පැවරන බවට වන තර්ජන භාවිත කර ඇත. මෙම නීතිවල පැවැත්ම නිසා අපරාධවලට ගොදුරු වූ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ඒවා පොලිසියට වාර්තා කිරීමට මැලි වේ.
- අධ්‍යාපන ආයතන, සෞඛ්‍ය සේවා ස්ථාන සහ ආගමන හා විගමන වැනි නිල හැඳුනුම්පත් ලේඛන අවශ්‍ය අවස්ථාවන්හිදී සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයින්ට වෙනස් කොට සැලකීමට හා හිරිහැර කිරීමට රාජ්‍ය නිලධාරීන් විශේෂයෙන් 399 වගන්තිය භාවිත කරන බව දන්නා කරුණකි.

**දේශීය වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- ශ්‍රී ලංකාවේ අපරාධ නීති යාවත්කාලීන කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීම සඳහා "දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීමේ විශේෂ කමිටුව" 2016 දී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බී.පී. අලුවිහාරේ එම කමිටුවේ ප්‍රධානීත්වය සහිත ව පත් කරන ලදී. පාර්ලිමේන්තුව විසින් සම්මත කර ඇති ව්‍යවස්ථාදායක නිර්දේශ වට කිහිපයක් මේ වනවිට එහි ඇතුළත් කර ඇත.  එම කමිටුව දැනට දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය පිළිබඳ සලකා බලයි.

**ජාත්‍යන්තර වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- 2012 දී ශ්‍රී ලංකාව සඳහා වූ දෙවන විශ්ව ආවර්තක සමාලෝචනයේදී (යූපීආර්) රටවල් දෙකක් (කැනඩාව, ආර්ජන්ටිනාව) වැඩිහිටියන් අතර සමලිංගික හැසිරීම නිර්සාපරධීකරණය කළ යුතු බවට ශ්‍රී ලංකාව වෙත නිර්දේශ කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකාව විසින් එම නිර්දේශ 'සටහන්' කර ගත් බව සඳහන් කරන ලදී.
- 2017 දී ශ්‍රී ලංකාව සඳහා වන තුන්වන විශ්ව ආවර්තක සමාලෝචනයේ දී (ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, බ්‍රසීලය, කැනඩාව, ස්වීඩනය, උරුගුවේ, හොන්ඩුරාස්) රටවල් හයක් වැඩිහිටියන් අතර සමලිංගික හැසිරීම නිර්සාපරධීකරණය කළ යුතු බවට ශ්‍රී ලංකාව වෙත නිර්දේශ කළේය. ඊට ප්‍රතිචාර වශයෙන් ද ශ්‍රී ලංකාව විසින් එම නිර්දේශ 'සටහන්' කර ගත් බව සඳහන් කරන ලදී.
- 2017 දී ශ්‍රී ලංකාව සඳහා වන තුන්වන තුන්වන විශ්ව ආවර්තක සමාලෝචනයේ දී ශ්‍රී ලංකාව නිල වශයෙන් ප්‍රකාශ කළේ "නීති සංග්‍රහයේ අඩංගු සියලුම වගන්ති ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීමට කැපවී සිටින" බවත් "එල්ජීබීටීඅයි ප්‍රජාවේ පුද්ගලයන්ට වෙනස් ලෙස සැලකීම සඳහා නීතියේ කිසිඳු විධිවිධානයක් ක්‍රියාත්මක නොවන බවට සහතික වීමට කැපවී සිටින බවත් ය."

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ :**

- සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන්ව වෙනස් කොට සැලකීම වැළැක්වීම සඳහා 399 වන වගන්තිය සංශෝධනය කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක යෝජනා හඳුන්වා දීම සහ සහාය දීම - අවම වශයෙන් සංක්‍රාන්ති සමජභාවී පුද්ගලයන් හට මෙය අදාළ නොවන බව පැහැදිලි කිරීමක් ඇතුළත් කිරීම.
- පාදඩ ආඥා පනතේ 7 වන වගන්තිය අවලංගු කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක යෝජනා හඳුන්වා දීම.
- ව්‍යවස්ථා සංශෝධනයට අනුව එල්ජීබීටීඅයි ප්‍රජාවන්ට අදාළ නොවන ලෙස දණ්ඩ නීති සංග්‍රහය සහ පාදඩ ආඥා පනත නිවැරදිව අර්ථ නිරූපණය කිරීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා රාජ්‍ය බලධාරීන්ට, විශේෂයෙන් පොලීසිය දිරිමත් කිරීම.

## C. කොට සැලකීමකින් තොර වීම ආරක්ෂා කිරීමට ක්‍රියා මාර්ග නොමැතිකම

**ගැටලුව :** ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ හා නෛතික රාමුව තුළ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත පදනම්ව වෙනස්කොට සැලකීම කළ නොහැකි බව හෝ සමානාත්මයෙන් යුක්තව සැලකිය යුතු බවට සඳහන් වූ විධිවිධාන නොමැතිකම නිසා එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට පූර්ණ ලෙස ප්‍රවේශ විය නොහැක.

### වර්තමාන තත්ත්වය

ලිංගික දිශානතිය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය මත වෙනස් කොට සැලකීම සියලු රාජ්‍ය බලධාරීන් වෙතින් අවස්ථා ගණනාවකදී සිදුවිය හැකිය. එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ සැබෑ හෝ හඳුනාගත් ලිංගික දිශානතිය හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය හේතුවෙන් අධ්‍යාපනය, රැකියාව, නිවාස හා සෞඛ්‍යය රැකවරණය ලබා ගැනීමේදී වෙනස්කම්වලට ලක්වීම් අත්විඳිති.

- **අධ්‍යාපනය -** පාසැල් හා විශ්ව විද්‍යාලවල සම වයසේ මිතුරන් විසින් හිරිහැර කිරීම සහ ගුරුවරුන් සහ පරිපාලකයින් විසින් වෙනස් කොට සැලකීම එල්ජීබීටීඅයි සිසුන්ට විවිධකාර ලෙස බලපානු ලැබේ. වයසට ගැළපෙන පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය සහ සම්බන්ධතා පැවැත්විය යුතු ආකාරය පිළිබඳ අධ්‍යාපනය නොමැතිකම අනෙකුත් සිසුන්ට මෙන්ම එල්ජීබීටීඅයි සිසුන්ට ද අහිතකර ලෙස බලපායි.
- **නිවාස -** එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් බොහෝදෙනා නිවාස සොයා ගැනීමේදී ගැටලුවලට මුහුණ දෙයි. තම පවුල්වලින් හදිසියේම නෙරපාහැරීම නිසා බොහෝ එල්ජීබීටීඅයි පුද්ගලයින් පදිංචිය සඳහා නිවාස සොයාගැනීමේ අවශ්‍යතාවයන්ට මුහුණ දෙමින් සිටී. එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ගේ අනන්‍යතාවයන් දැනගත් විට තාවකාලික, කුලී හෝ නේවාසිකාගාර නවාතැන් අයිතිකරුවන් විසින් ඔවුන්ව එම ස්ථානවලින් ඉවත් කරනු ලැබේ. ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා සහ සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයින් දෘශ්‍යමාන ලෙස හඳුනාගත හැකි නිසා ඔවුන් විශේෂයෙන් අවදානමට ලක්වේ.
- **සෞඛ්‍ය සේවා** - එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගෙන් සහ සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේදී වෙනස්කම්වලට හා හිරිහැරවලට ලක්වීම හේතුවෙන් සාමාන්‍ය ජනතාවට සාපේක්ෂව ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටී. (වැඩි විස්තර සඳහා, F කොටස බලන්න)
- **රැකියා** - එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් රැකියා ලබා ගැනීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට නිසි අනන්‍යතා ලියකියවිලි නොමැතිකම සහ ඔවුන් දෘශ්‍යමාන ලෙස හඳුනාගත හැකි නිසා විශේෂයෙන් රැකියා ලබා ගැනීමට නොහැකි වී තිබේ. රැකියා ලැබුණමුත් බොහෝ එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ සැබෑ අනන්‍යතාවයන් සඟවා සිටින අතර අන්අය තම අනන්‍යතාවය දැනගනිදැයි බියෙන් පසු වේ. එල්ජීබීටීඅයි පුද්ගලයන් ලෙස ප්‍රසිද්ධියේ හඳුනාගෙන ඇති අය දිනපතා වෙනස් කොට සැලකීම්වලට (අඩු වැටුප් හා උසස්වීම් හා අවස්ථාවන් නොලැබීම් ඇතුළුව) සහ වාචික හා ශාරීරික හිංසනයන්ට මුහුණ දෙති.
- **රාජ්‍ය පරිපාලනය** - එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් පළාත් පාලන නිලධාරීන්ගේ සිට මධ්‍යම රජයේ නිලධාරීන් දක්වා, විශේෂයෙන් රජයේ සේවාවන් ලබා ගැනීමේදී (ග්‍රාම නිලධාරීන් වැනි) රාජ්‍ය නිලධාරීන්ගෙන් විවිධ අවස්ථාවන්හි වෙනස්කම් කිරීම් අත්විඳිති.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් විශේෂයෙන් ඔවුන්ගේ ගෘහස්ත පරිසරය තුළ පමණක් නොව පොදු අවකාශයන්හිද ලිංගික, මානසික හා ශාරීරික හිංසනය අත්විඳියි.
- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් විශේෂයෙන් ඔවුන් දෘශ්‍යමාන ලෙස හඳුනාගත හැකි වන නිසා සහ නිසි හැඳුනුම්පත් ලබා ගැනීමට ඇති ඉඩකඩ අඩු නිසා මෙම සියලු ආකාරයේ වෙනස්කම් කිරීම්වලට ලක්වනු ඇත.

### නෛතික / ප්‍රතිපත්ති සන්දර්භයඃ

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය මගින් ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රීපුරුෂ භාවය, දේශපාලන මතය සහ උපන් ස්ථානය යන ආකාරයන් අනුව වෙනස් කොට සැලකීම හා සමානාත්මතාවය ආරක්ෂා කර ඇති පරිදිම ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය පැහැදිලිව හඳුනාගෙන නොමැත.

- 12 වන වගන්තියේ "හෝ එවැනි ඕනෑම හේතුවක්" යන්නෙන් අදහස් කරන්නේ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය නිසා වෙනස් කොට නොසැලකීමේ පදනමක් ලෙස වක්‍රව අර්ථ දැක්විය හැකිවුවත් එය දැඩි ලෙස අධිකරණ අභිමතය මත රඳා පවතී.
- ඊට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) සහ 80 (3) ව්‍යවස්ථාවන් බලාත්මක කිරීමෙන් පසු නීති සමාලෝචනය කිරීම තහනම් කරයි. මෙයින් අදහස් කරන්නේ එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට වෙනස් කොට සැලකෙන නීති අවලංගු කිරීම අධිකරණය මඟින් සමාලෝචනය කළ නොහැකි බවත් එවැනි වෙනස්කම් කිරීම් සිදු නොවීමට වග බලා ගත යුතු බවත් ය.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් වෙනස් කොට සැලකීමෙන් හෝ වෛරී අපරාධවලින් ආරක්ෂා කරන වෙනත් නීති නොමැත.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ සාමාන්‍ය නීති මඟින් වෙනස් කොට සැලකීමට එරෙහිව ආරක්ෂා කර ඇති ඛාණ්ඩ ලෙස ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව පැහැදිලිව හඳුනාගැනීම මෙන්ම එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ඔවුන්ගේ ලිංගික දිශානතිය හා ස්ත්‍රීපුරුෂ සමාජභාවය අනුව තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නීතිමය සහනයක් ලබා ගැනීමට පශ්චාත් නීති පැනවීමේ අධිකරණ සමාලෝචනයට ඉඩ දීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) සහ 80 (3) වගන්ති අහෝසි කිරීම හඳුනාගත යුතුය.

**දේශීය වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- 2015 දී පත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජිත කමිටුව (PRC) 2016 දී මහජන අදහස් විමසීමෙන් පසුව සිය වාර්තාව නිකුත් කළ අතර සමානාත්මතාවය සහ වෙනස් කොට සැලකීම පිළිබඳ ව්‍යවස්ථාමය විධිවිධානවලට 'ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජ භාව දිශානතිය' ඇතුළත් කිරීමට නිර්දේශ කළ අතර පෞද්ගලිකත්වයට ඇති අයිතිය ද ඇතුලත් කළ යුතු බවට නිර්දේශ කරන ලදී. 2019 දී ව්‍යවස්ථාදායක සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද කෙටුම්පත් ව්‍යවස්ථාවට මෙම විධිවිධාන ඇතුළත් විය.
- 2017 ජනවාරි මාසයේදී මානව හිමිකම් ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මට ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය ඇතුළු එල්ජීබීටීඅයි පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ඇතුළත් කිරීම කැබිනට් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
- පාසල් විෂය මාලාවේ පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය යාවත්කාලීන කිරීම සිදු කිරීමට කාන්තාවන් සහ ළමුන් පිළිබඳ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කමිටුව විසින් 2016 සිට අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය, ළමා ආරක්ෂණ අධිකාරිය, විද්වතුන් සහ පර්යේෂකයින් වැනි පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් පුළුල් ලෙස කටයුතු කර ඇති අතර වාර්තා ගණනාවක් ද සකසා ඇත.
- කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම තුරන්කිරීමේ කමිටුවට සෙවණැලි වාර්තා සකස් කිරීමේදී එල්ජීබීටීඅයි සංවිධාන විසින් සමරිසි, ද්විරිසි හා සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් මුහුණ දෙන විශේෂිත වෙනස්කම්, පොලිස් හිරිහැර හා ප්‍රචණ්ඩත්වය, රැකියාව තුළ වෙනස්කම් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැනි විශේෂ අවස්ථා ඉස්මතු කර තිබේ.
- ශ්‍රී ලංකා එල්ජීබීටීඅයි සංවිධාන විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ කාරක සභාවට ලබා දුන් සෙවණැලි වාර්තා මඟින් සමරිසි, ද්විරිසි හා සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් මුහුණ දෙන විශේෂිත වෙනස්කම්, පොලිස් හිරිහැර හා ප්‍රචණ්ඩත්වය, රැකියා ස්ථාන තුල මුහුණ දෙන වෙනස්කම් වලට ලක් කිරීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැනි දෑ ඉස්මතු කර තිබේ.

**ජාත්‍යන්තර වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- 2017 දී "එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුව" එල්ජීබීටීඅයි පුද්ගලයින්ට එරෙහි හිංසනයන්ට එරෙහිව සටන් කිරීම හා වැළැක්වීම සඳහා හදිසි පියවර ගැනීම සහ සියලු මානව හිමිකම්, විශේෂයෙන් සෞඛ්‍ය, අධ්‍යාපනය, රැකියාව සහ නිවාස, සහ එහි විෂය පථය තුළ ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාව ඇතුළත් පරිපූර්ණ වෙනස් කොට සැලකීම් විරෝධී නීතියක් සම්මත කිරීම.

- 2017 දී කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන්කිරීමේ කමිටුව විසින් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන්කිරීමේ සම්මුතියට එරෙහි ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. ලිංගික අනන්‍යතාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් මත වෙනස්කොට නොසැලකීම සහ ශ්‍රී ලංකාව "ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සහ අයිතිවාසිකම් පිළිබඳ වයසට ගැළපෙන පරිපූර්ණ අධ්‍යාපනයක් ආයතනිකකරණය කිරීම, වගකිවයුතු ලිංගික හැසිරීම් ආමන්ත්‍රණය කිරීම" නිර්දේශ කර තිබේ.
- 2018 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව නිර්දේශ කළේ එල්ජීබීටීඅයි ළමුන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාව පුළුල් ලෙස වෙනස් කොට සැලකීම් වැළැක්වීමේ ආරක්ෂාවක් පැනවිය යුතු බවයි. ශ්‍රී ලංකාව "වෙනස් කොට නොසැලකීම හා සමානාත්මතාවය පිළිබඳ කොටස් සියලු වයස්වල ළමුන් සඳහා අනිවාර්ය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම" නිර්දේශ කර ඇත.
- 2017 දී ශ්‍රී ලංකාවේ තුන්වන විශ්වීය අවර්තක සමාලෝචනයේදී ශ්‍රී ලංකාව නිල වශයෙන් ප්‍රකාශ කළේ "නීති ප්‍රතිසංස්කරණ සඳහා කැපවී සිටින බවත් ලිංගික දිශානතිය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෙනස් කොට නොසැලකීම සහතික කිරීම" කරන බවත්ය.

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ :**

*කෙටි-මධ්‍ය කාලීන*

- ලිංගික අනන්‍යතාවය සහ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අනන්‍යතාවය මත වෙනස්කොට සැලකීමට එරෙහි පුළුල් පරාසයක වෙනස් කොට සැලකීම් විරෝධී නීති හඳුන්වා දීම සහ සහාය දීම.
- ඉදිරි මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලසුම් (NHRAPs) හි වෙනස් කොට සැලකිය යුතු කාණ්ඩ ලෙස ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂභාවය අනන්‍යතාවය ඇතුළත් කිරීමට සහාය වීම සහ ශක්තිමත් කිරීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ඔවුන්ගේ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ පිළිබඳව (විශේෂයෙන් අධ්‍යාපන, සෞඛ්‍ය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ) SOC නඩු විභාගවලදී අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන් ප්‍රශ්න කිරීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට සංවේදීතාවයෙන් යුතුව සැලකීම පිළිබඳ අධ්‍යාපන, සෞඛ්‍ය හා පරිපාලන රාජ්‍ය ආයතනවල රාජ්‍ය නිලධාරීන් සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට සහාය වීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් සමග කටයුතු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපස සිටින රාජ්‍ය නිලධාරීන්ට (ගුරුවරුන්, පොලිස් නිලධාරීන් සහ ග්‍රාම නිලධරින් වැනි) සංවේදීතා පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා සහාය වීම.
- පාසැල්වලට පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය හඳුන්වාදීම සඳහා කාන්තාවන් සහ ළමුන් පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව (SOC) හි සහයෝගය දිගටම ලබාගැනීම සහ වෙනස් කොට නොසැලකීම සහ එල්ජීබීටීඅයි ප්‍රජාව පිළිබඳ සංවේදී කරුණු විෂය මාලාවට ඇතුළත් කිරීම සඳහා සහාය වීම.

*දීර්ඝ කාලීන*

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස් කොට සැලකීම සම්බන්දයෙන් ඇති වගන්තියට ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ සමජභාවී අනන්‍යතාව මත වෙනස්කොට නොසැලකීමේ වගන්තිය ඇතුළත් කිරීමට යෝජනා හඳුන්වා දීම සහ සහාය දීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 (1) සහ 80 (3) වගන්ති අවලංගු කිරීම සඳහා නීති සම්පාදනය කිරීමෙන් පසු අධිකරණ සමාලෝචනයට ඉඩ දීම සඳහා යෝජනා හඳුන්වා දීම සහ සහාය දීම.

## D. ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනා ගැනීම

**ගැටලුව :** සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ අන්තර් ලිංගික ශ්‍රී ලාංකිකයින් ඔවුන්ගේ ස්ත්‍රීපුරුෂ සමාජ භාවය නිල සන්දර්භය තුළ පිළිගැනීමේ ගැටලු ගණනාවකට මුහුණ දී සිටී.

- ශ්‍රී ලංකාවේ, උප්පැන්න සහතික සහ හැඳුනුම්පත් එදිනෙදා ජීවිතයේ බොහෝ ස්ථාන වලදී පෙන්විය යුතු ය. (නිදසුනක් වශයෙන්, පුද්ගලයෙකු රැකියාවක් සඳහා ඉල්ලුම් කරන විට, බැංකුවකට යන විට, රජයේ රෝහලක වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නා විට, රජයේ කාර්යාලයකට පැමිණෙන විට හෝ පොලිසිය සමග කටයුතු කිරීම ආදී කරුණු වලදී.) එවැනි සෑම තත්ත්වයක් තුළම, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු හෝ අන්තර්ලිංගික පුද්ගලයෙකුගේ නිල ලියකියවිලි ඔවුන්ගේ නමට හා ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයට නොගැළපේ නම් ඔවුන් නින්දාවට, වෙනස් කොට සැලකීමට, හිරිහැරයට හා ප්‍රචණ්ඩත්වයට මුහුණ පෑමට වැඩි ඉඩකඩක් ඇත.

- නෛතික ස්ත්‍රීපුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය නිකුත් කිරීමේ ක්‍රමයක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2016 ජුනි මාසයේ දී චක්‍රලේඛයක් මඟින් හඳුන්වා දී ඇති අතර, උපතේදී පවරා ඇති ලිංගයට වඩා ඔවුන් කැමති ස්ත්‍රීපුරුෂ භාවය සඳහන් කර නව හැඳුනුම්පතක් ලබා ගැනීමට මෙය සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර් ලිංගික පුද්ගලයන්ට උපකාර වේ. එනමුත් එම ක්‍රියාවලිය ගැටලුසහගත ය.

**වර්තමාන තත්ත්වය :**

- නෛතික ස්ත්‍රී පුරුෂ සමාජභාවය හඳුනාගැනීමේ සහතිකය සඳහා අයදුම්කරන්නන් "ශල්‍ය හා හෝමෝන ප්‍රතිකාර" ලබමින් සිටිය යුතුය. මේ සඳහා සම්මත ක්‍රමවේදය වන්නේ, මුලින්ම අදාළ පුද්ගලයා පළමුව මනෝ චිකිත්සකයෙකුගෙන් උපදෙස් ලබා ගැනීම කළ යුතු අතර ශල්‍යකර්ම ක්‍රියාවලියට එම පුද්ගලයා සුදුසුද යන්න මනෝ චිකිත්සකවරයා විසින් තීරණය කිරීම කළ යුතු ය. ඉන්පසු මනෝ චිකිත්සකවරයා නිල ලිපියක් නිකුත් කිරීමෙන් පසුව, එම පුද්ගලයාට ශල්‍යකර්මයකට යාමට පෙර හෝමෝන ප්‍රතිකාර ලබා ගත හැකිය. මනෝ චිකිත්සකවරයා අවසාන වශයෙන් සහතික කළ යුත්තේ පුද්ගලයා "ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කිරීමේ ක්‍රියාවලියට භාජනය වූ" බවයි.
- එවැනි ක්‍රියා පටිපාටි මිල අධික වන අතර ප්‍රධාන නගරවලින් පිටත නොමැත. ඇතැම් ශල්‍යකර්ම ශ්‍රී ලංකාවේ සම්පූර්ණයෙන්ම කරගත නොහැකි අතර ඒවා සිදු කළ හැක්කේ විදේශයන්හි පමණි. එබැවින්, ලේඛන වෙනස් කිරීම් සාක්ෂාත් කර ගැනීම සඳහා සංක්‍රාන්ති සමාජභාවී ශ්‍රී ලාංකිකයින්ට දරාගත නොහැකි, ප්‍රවේශ වීමට නොහැකි හෝ අවශ්‍ය නොවන ක්‍රියා පටිපාටිවලට භාජනය වීමට සිදුවේ.

- නෛතික ස්ත්‍රී පුරුෂ සමාජභාවී හඳුනාගැනීමේ සහතිකය ලබාගත් පුද්ගලයින්ගේ ඇතැම් නිල හැඳුනුම්පත් ලේඛන වෙනස් කිරීමෙන් පසුවද ඔවුන්ගේ පෙර ස්ත්‍රීපුරුෂ අනන්‍යතාවය පැහැදිලිව නව ලේඛනවල සඳහන් වීමේ අවාසිය ඇත. නිදසුනක් ලෙස, මෙම ක්‍රියාවලිය හරහා ලබාගත් උප්පැන්න සහතික සංශෝධනය කරනු ලබන්නේ පුද්ගලයෙකුගේ දැනට පවතින උප්පැන්න සහතිකයේ භෞතික වෙනස් කිරීමක් කිරීමෙන් මිස නව සහතිකයක් නිකුත් කිරීමෙන් නොවේ. ඒ හා සමානව, විදේශ ගමන් බලපත්‍ර ලබා ගැනීමේදී එය දරන්නා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු සහ එම පුද්ගලයාගේ පෙර නම සහ ස්ත්‍රී පුරුෂ භාවය නව විදේශ ගමන් බලපත්‍රයෙහි සඳහන් වනු ඇත.

**දේශීය වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතරමැදියෙකු ලෙස කටයුතු කිරීමත් සමග ශ්‍රී ලංකාවේ එල්ජීබීටීඅයි සංවිධාන විසින් වසර ගණනාවක් තිස්සේ කරන ලද පුළුල් බලපෑම්වලින් පසුව නෛතික ස්ත්‍රීපුරුෂ සමාජභාවය වෙනස් කිරීමේ සහතික ලබා දීමේ ක්‍රියාවලිය ස්ථාපිත කරන ලදී. කෙසේ වෙතත්, එම ක්‍රියාවලියේ දී රජයේ නිලධාරීන්ට එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් කෙරෙහි පූර්ණ සංවේදීතාවයක් දැක්විය නොහැකි බවත්, එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් සිටින තැන අනුව පවා ව්‍යවස්ථාදායක හා ආයතනික බාධක සහ සීමාවන් පවතින බවත් පෙන්නුම් කරන්නේ ය. උදාහරණයක් ලෙස, 1954 උපත්, මරණ සහ විවාහ පනතේ විධිවිධාන ගණනාවක් මඟින් නෛතික ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස්කිරීමේ සහතික හිමියන්ට නව උප්පැන්න සහතික නිකුත් කිරීම වළක්වයි.

**ජාත්‍යන්තර වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන්**

- ජාත්‍යන්තරව සිදු කරන යහපත් භාවිතයන්ට අනුව, ස්ත්‍රීපුරුෂ භාවය නීත්‍යානුකූලව හඳුනාගැනීම සඳහා ශල්‍ය හා හෝමෝන ප්‍රතිකාර අවශ්‍ය නොවේ. බොහෝ රටවල, පුද්ගලයා වයස 18ට වැඩි නම් සහ ඔවුන් උපතේදී හඳුනා නොගත් ලිංගයක් තුළ ජීවිත කාලය පුරාම ජීවත් වීමට අවශ්‍ය යැයි තීරණය කර ඇත්නම්, ඔවුන්ට තමා කැමති/හඳුනාගත් ලිංගය තුළ සරල ක්‍රියාවලියක් හරහා ස්ත්‍රී පුරුෂභාවය හඳුනා ගැනීමේ සහතිකයක් ලබා ගත හැකිය.

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ:**

- වෛද්‍ය ක්‍රියා පටිපාටිවලින් හෝ බලහත්කාරයෙන් තොරව ස්වයං ප්‍රකාශනයකින්, ඉක්මන්, විනිවිද සහ පහසුවෙය් ප්‍රවේශ විය හැකි ක්‍රියාවලියක් හරහා සංක්‍රාන්ති සමාජභවි සහ අන්තර් ලිංගික පුද්ගලයින්ගේ නිල අනන්‍යතා ලේඛනවල ස්ත්‍රීපුරුෂ භාවය හඳුනාගැනීමේ ක්‍රියාවලියකට ඉඩ සලසන නීති හඳුන්වා දීම හෝ සහාය දීම.
- සංක්‍රාන්ති සමාජභාවී සහ අන්තර්ලිංගික පුද්ගලයින්ට පහසුවෙන් නව නිල හැඳුනුම්පත් නිකුත් කිරීමට ඉඩ දීම සඳහා 1954 උපත්, මරණ සහ විවාහ පනත සහ 1954 සංක්‍රමණිකයන් සඳහාවූ පනත සංශෝධනය කිරීම.
- වෙනස් කළ සියලුම නිල හැඳුනුම්පත් ලේඛන අලුතින් නිකුත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අතර සහයෝගීතාව වෙනුවෙන් පෙනී සිටීම.

## E. සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම

**ගැටලුව :** අනෙකුත් ප්‍රජාවන් හා සසඳන විට එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ප්‍රමාණවත් සෞඛ්‍ය සේවාවක් ලබා ගැනීමේ දී විවිධාකාර අවදානම් වලට ලක් වේ.

**වර්තමාන තත්ත්වය :**

- සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට යෑමේදී එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම වෛද්‍ය ඉතිහාසය තුළ බොහෝ විට නොසලකා හැර ඇති අතර ඒ පිළිබඳව සැලකිල්ලට ලක් කර ද නැත. තමාගේ පුද්ගලික වෛද්‍ය තොරතුරු සුළු සේවකයන් සමග (පිරිසිදු කරන්නන් සහ ආරක්ෂක කාර්ය මණ්ඩලය වැනි වෛද්‍ය නොවන රෝහල් සේවකයින් සමග) බොහෝ වෛද්‍යවරු, හෙදියන් බෙදා ගන්නා බව එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්, විශේෂයෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් වාර්තා කරයි. එවැනි පෞද්ගලිකත්වයට සිදුවන හානි වීම් නිසා සෞඛ්‍ය පහසුකම් ලබාගැනීමට එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් මැලි බවක් දක්වන අතර එය ඔවුන් අනවශ්‍ය ආතතියකටද ලක් කරයි.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් සහ විශේෂයෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් රජයේ සෞඛ්‍ය පහසුකම් වලදී බිය ගැන්වීම්, හිරිහැර කිරීම් සහ වෙනස්කොට සැලකීම් අත්විඳිති. එල්ජීබීටීඅයි පුද්ගලයින් රෝහල්වල සහ සායනවලදී අනවශ්‍ය ප්‍රශ්න කිරීම් හා සමච්චලයට ලක්වන බව නිතර වාර්තා වේ.
- වෛද්‍ය කාර්ය මණ්ඩලය විසින් ඔවුන්ගේ ලිංගේන්ද්‍රිය අනවශ්‍ය ලෙස පරීක්ෂා කිරීම වැනි ලිංගික හිරිහැර හා වෙනත් ආකාරයේ හිරිහැර කිරීම්වලට ලක් කරන බවට ශ්‍රී ලාංකික සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් විසින් වාර්තා කර ඇති අතර, ඔවුන්ට ප්‍රතිකාර ලබා දීමේදී අනවශ්‍ය ලෙස ප්‍රමාද කරන බවත් ඔවුන් සඳහන් කර සිටී.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින්ට ලබා ගත හැකි සෞඛ්‍ය සේවා පිළිබඳ තොරතුරු හා දැනුවත් කිරීම් රජය විසින් නිසි ලෙස සන්නිවේදනය කරනු නොලැබේ. විශේෂයෙන් තරුණ ප්‍රජාවට සහ නාගරික නොවන පරිසරයන්හි වාසය කරන්නන්ට එච්.අයි.වී සහ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග (ලිංගාශ්‍රිත රෝග) සඳහා වන පරීක්ෂණ, හෝමෝන ප්‍රතිකාර සහ රජයේ රෝහල්වල ඇත ස්ත්‍රීපුරුෂ සමාජභාවය තහවුරු කිරීමේ සැත්කම් වැනි වැදගත් සේවාවන් පිළිබඳ දැනුවත් කිරීමක් වී නොමැත.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් සැලකිය යුතු මානසික සෞඛ්‍ය අභියෝගයන්ට මුහුණ දෙයි. සාමාන්‍ය ජනතාවට වඩා වැඩි අනුපාතයකින් තරුණ එල්ජීබීටීඅයි ප්‍රජාව සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් හට සියදිවි නසාගැනීමේ සිතුවිලි ඇති බවත්, සියදිවි නසා ගැනීමට තැත් කරන බවත් වාර්තා වේ. එසේ තිබියදීත්, එල්ජීබීටීඅයි ප්‍රජාවන්හි ගැටලුවලට සංවේදී වන ප්‍රමාණවත් මනෝ සමාජීය උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවාවන් ශ්‍රී ලංකාව තුළ නොමැත.
- ශ්‍රී ලංකාවේ අඩු එච්.අයි.වී සම්ප්‍රේෂණ අනුපාතය සාමාන්‍යයෙන් වෙනස් නොවී පවතී. මේ හේතුව සහ එච්.අයි.වී. සඳහා අධි අවදානමක් පවතින ප්‍රජාවක් ලෙස ශ්‍රී ලාංකික එල්ජීබීටීඅයි ප්‍රජාව හඳුනාගෙන ඇති නිසා ජාතික එච්.අයි.වී. සහ ඒඩ්ස් මර්දන වැඩසටහන එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ඉලක්ක කරමින් ඔවුන් වෙත ළඟා වීමට වැඩසටහන් සිදු කරනු ලබයි. ග්‍රාමීය ප්‍රදේශවල, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට වඩා නාගරික එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් ඉලක්ක කරමින් මෙම වැඩසටහන් සිදු කරනු ලබයි.
- ජාතික එච්.අයි.වී. සහ ඒඩ්ස් මර්දන වැඩසටහන විසින් සංක්‍රාන්ති සමාජභාවී පිරිමින්ව (කාන්තාවන් ලෙස ඉපිද පිරිමි ලෙස හඳුනාගත්) එම වැඩසටහන්වලින් ඉවත් කර දමා ඇති අතර සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් (පිරිමි ලෙස ඉපිද කාන්තාවන් ලෙස හඳුනාගත්) පිරිමින් සමග ලිංගිකව හැසිරෙන පිරිමි යටතට දමා ඔවුනට සේවාවන් සපයයි.

**දේශීය වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- ඉහත කරුණු සම්බන්ධව ශ්‍රී ලංකා එල්ජීබීටීඅයි සංවිධාන විසින් සෞඛ්‍ය සේවා සපයන ආයතනවලට සහ නිලධාරීන්ට තම අදහස් කිහිපවාරයක්ම ඉදිරිපත් කර තිබේ. මෙම මැදිහත්වීම් සමහරක් සාර්ථක වී ඇති නමුත් බොහෝ විට විශේෂිත අවස්ථාවන්ට පමණක් සීමා වේ. (නිදසුනක් වශයෙන්, යම් රෝහලක වෛද්‍යවරුන්ගෙන් එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට වඩා සංවේදී වන මෙන් ඉල්ලා සිටින අවස්ථාවක). මෙම ප්‍රජාවන්ට සිදු වන වෙනස්කොට සැලකීම්, හිරිහැර කිරීම් ආදිය ආමන්ත්‍රණය කරන ප්‍රතිසංස්කරණ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කර නොමැත.

**ජාත්‍යන්තර වශයෙන් සිදු වී ඇති සංවර්ධනයන් :**

- එල්ජීබීටීඅයි පුද්ගලයන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා අනෙකුත් ප්‍රජාවන්ට වඩා වෙනස් විය හැකි බවටත් සෞඛ්‍ය සේවා පද්ධති බොහෝ විට මෙම අවශ්‍යතා සපුරාලීමට හෝ එල්ජීබීටීඅයි පුද්ගලයන්ට සංවේදීතාවයෙන් යුතුව සැලකීමට අපොහොසත් වන බවටත් ජාත්‍යන්තර පිළිගැනීමක් තිබේ. රටවල් ගණනාවක් එල්ජීබීටීඅයි ප්‍රජාවන්ට විශේෂිත සෞඛ්‍ය සේවාවන් ලබා දෙන අතර (එල්ජීබීටීඅයි ප්‍රජාවේ ලිංගික සෞඛ්‍ය සේවා ආදී) කාන්තාවන්ට හා වැඩිහිටියන්ට සේවාවන් ලබාදීමට පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයට සමානව එල්ජීබීටීඅයි රෝගීන් සමඟ කටයුතු කිරීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් ද ඇත.

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ:**

- ශ්‍රී ලාංකික එල්ජීබීටීඅයි ප්‍රජාවට පරිපූර්ණ සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පුළුල් සෞඛ්‍ය උපාය මාර්ගයක් සකස් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ එල්ජීබීටීඅයි ප්‍රජාව සමඟ කටයුතු කිරීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට ප්‍රතිකාර කිරීමේදී රෝගීන්ගේ රහස්‍යභාවය පවත්වා ගැනීම සහ වෙනස්කොට සැලකීම හා හිරිහැර වළක්වා ගැනීම සඳහා දිවයින පුරා ව්‍යාප්ත වූ සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම සහ කාර්ය මණ්ඩලයට පරිපූර්ණ මාර්ගෝපදේශ සකස් කිරීම සහ නිකුත් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සමග කටයුතු කිරීම.
- ජාතික ඒඩ්ස් කමිටුව වැනි ජාතික සෞඛ්‍ය ආයතනවල එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් නියෝජනය කිරීම සඳහා ඉඩකඩක් නිර්මාණය කිරීම වෙනුවෙන් පෙනී සිටීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින් සඳහා ඇති රාජ්‍ය සෞඛ්‍ය සේවා පිළිබඳ විශේෂයෙන්ම නාගරික නොවන හා තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් ඔවුන් දැනුවත් කිරීම් වැඩි කිරීම වෙනුවෙන් පෙනී සිටීම.
- විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල සහ ප්‍රධාන නගරවලින් පිටත සිටින එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින්ට ලබා ගත හැකි සෞඛ්‍ය සේවා (විශේෂයෙන් එච්අයිවී වැළැක්වීමේ හා ප්‍රතිකාර සේවා) ඇතිකිරීම වෙනුවෙන් පෙනී සිටීම.
- එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට මනෝ සමාජීය උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවා සැපයීම ශක්තිමත් කිරීම වෙනුවෙන් පෙනී සිටීම.

## F. ලිංගිකත්වය වෙනස් කිරීමට සිදු කරන පරිවර්තන චිකිත්සාව

**ගැටලුව :** ලිංගිකත්වය වෙනස් කිරීමට සිදු කරන පරිවර්තන චිකිත්සක සේවාවන් නිසාවෙන් එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට සැලකිය යුතු මානසික හා ශාරීරික පීඩාවක් ඇති කරන අතර ඔවුන් සහ ඔවුන්ගේ පවුල් සූරා කෑමට ලක් කරයි.

**වර්තමාන තත්ත්වය :**

- ලිංගිකත්වය වෙනස් කිරීමට සිදු කරන පරිවර්තන චිකිත්සක සේවාවන් යනු මනෝ විද්‍යාත්මක හෝ අධ්‍යාත්මික මැදිහත්වීම් භාවිත කරමින් පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය සමරිසි හෝ ද්වීරිසි සිට විෂමලිංගික (හෝ සංක්‍රාන්ති සමාජභාවී සිට සිස්ජෙන්ඩර් දක්වා) වෙනස් කිරීමට උත්සාහ කිරීමේ ව්‍යාජ විද්‍යාත්මක භාවිතයකි. මෙම පරිවර්තන චිකිත්සක සේවාවන් ශ්‍රී ලංකාවේ වෛද්‍ය හෝ ආගමික ආයතන මෙන්ම පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයන් විසින් ද සපයනු ලැබේ.
- පුද්ගලයෙකුගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවය වෙනස් කළ හැකි බවට විද්‍යාත්මක සාක්ෂි විශාල ප්‍රමාණයක් නොමැත. ලෝක සෞඛ්‍ය සංවිධානය, ඇමරිකානු මනෝචිකිත්සක සංගමය සහ මෑතකදී ශ්‍රී ලංකා මනෝ චිකිත්සක විද්‍යාලය ඇතුළු ප්‍රමුඛ බලධාරීන් සියලු දෙනාම පිළිගන්නේ සමරිසි, ද්වීරිසි හා සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් ඇතුළුව විවිධ ලිංගික දිශානතියන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාවයන් මානසික රෝග නොවන බවයි.
- මෙම පරිවර්තන ප්‍රතිකාර සේවා සහ ස්ථාන පිළිබඳව ශ්‍රී ලංකාවේ පුවත්පත් සහ මාධ්‍යවල ප්‍රචාරය කෙරේ. මෙම සේවාවන් මුළුමනින්ම නියාමනය කර නොමැති අතර ඒවා පිළිබඳ රජයේ අනුමැතියක් හෝ අධීක්ෂණයක් නොමැත. සමලිංගික ලිංගික හැසිරීම අපරාධීකරණය කර තිබීම නිසා මෙම සේවාවන් නිදහසේ ක්‍රියාත්මක වනු දැකිය හැක.
- මෙම පරිවර්තන චිකිත්සක සේවාවන් භාවිත කරන ක්‍රම වෙනස් වන අතර, බලහත්කාරයෙන් ලබා දෙන උපදේශන ක්‍රම, එල්ජීබීටීඅයි අනන්‍යතාවන් සුව කරන බව පවසන ඖෂධ නියම කිරීම සහ විද්‍යුත් විච්ඡේදක චිකිත්සාව වැනි ආන්තික ක්‍රම ඇතුළත් වේ.
- එසේම මෙම පරිවර්තන චිකිත්සාවට භාජනය වන පුද්ගලයන් හට දිගු කාලයක් පවතින මානසික පීඩාවක් ලැබීම හා ඔවුන්ගේ මනසට දැඩි ලෙස හානි වීමක් සිදු විය හැකිය. පරිවර්තන චිකිත්සාව සඳහා විවිධ ක්‍රම භාවිත කරන නිසාත්, එල්ජීබීටීඅයි පුද්ගලයන්ට එරෙහිව පවත්නා සමාජ අගතිය නිසාත්, මෙයින් සිදුවන හානිය පිළිබඳව නිසි ලෙස ආමන්ත්‍රණය කිරීමට අපොහොසත් වී ඇත.
- මෙම පරිවර්තන ප්‍රතිකාර සේවා ලබා ගැනීමට තම පවුල් සහ සේවා සපයන්නන් විසින් එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් හට බලපෑම් කරනු ලැබේ. චිකිත්සක වැඩසටහන ආරම්භ කිරීමෙන් පසු තමන් අකමැති වුවත් චිකිත්සාව නැවැත්වීමට එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් හට කිසිදු අවකාශයක් නොලැබෙන අතර, නේවාසිකව සිදු කරන මෙවැනි පරිවර්තන චිකිත්සක වැඩසටහන්වලදී තමාට අවශ්‍ය වුවත් එයින් ඉවත්ව යාමට එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන් අවස්ථා අහිමි විය හැකිය.

**දේශීය වර්ධනය :**

- ශ්‍රී ලංකාවේ පරිවර්තන චිකිත්සක සේවාවන් බහුලව පවතින බව ශ්‍රී ලංකා එල්ජීබීටීඅයි සංවිධාන වැඩි වැඩියෙන් පෙන්වා දී තිබේ.
- සමරිසි, ද්වීරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී (එල්ජීබීටී) ප්‍රජාවන් ඇතුළු විෂමලිංගික නොවන, ලිංගික දිශානතිය සහ විවිධ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවන් මානසික සෞඛ්‍ය ආබාධ නොවන බවට ශ්‍රී ලංකා මනෝ චිකිත්සක විද්‍යාලය (එස්එල්සීපී) 2018 ජූලි මාසයේදී නිවේදනය කරණ ලදී. එබැවින් එල්ජීබීටීඅයි ශ්‍රී ලාංකිකයන්ට ඔවුන්ගේ අනන්‍යතාවන් සඳහා මේ ආකාරයෙන් ප්‍රතිකාර කිරීමට අවශ්‍ය නොවේ.

**ජාත්‍යන්තර වර්ධනය :**

- පරිවර්තන චිකිත්සක සේවාවන් වධහිංසාවෙන් යුක්ත, කුරිරු, අමානුෂික හා පහත් ලෙස සැලකීම හෝ දඬුවම් ලබා දෙන බවට ජාත්‍යන්තර පිළිගැනීමක් වර්ධනය වෙමින් පවතින අතර මෙය බලහත්කාරයෙන් ආයතනිකකරණය කිරීමේ දී අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීමට එරෙහි වීමේ අයිතිය ද උල්ලංඝනය වේ .
- ආජන්ටිනාව, බ්‍රසීලය, මෝල්ටාව, ඉක්වදෝරය, තායිවානය, කැනඩාව, ස්පාඤ්ඤය ඇතුළු රටවල් ගණනාවක් මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත කිහිපයකම පරිවර්තන ප්‍රතිකාර තහනම් කිරීමට පියවර ගෙන තිබේ.
- බහුජාතික හා ජාතික සෞඛ්‍ය සංවිධාන විශාල සංඛ්‍යාවක් මෙම පරිවර්තන චිකිත්සාව දැඩි ලෙස විවේචනය කරන අතර එය තහනම් කරන ලෙස ඉල්ලා සිටිති.

**මන්ත්‍රීවරුන් සඳහා නිර්දේශ:**

- ශ්‍රී ලංකාවේ පරිවර්තන චිකිත්සක ප්‍රතිකාර සේවා තහනම් කිරීම සඳහා නීති සම්පාදනය කිරීම සහ සහාය දීම.
- පරිවර්තන චිකිත්සක සේවා සපයන්නන් හඳුනාගෙන එම ස්ථාන වසා දැමීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව කටයුතු කිරීම.
- පරිවර්තන චිකිත්සක සේවා සැපයීම නැවැත්වීම සඳහා සියලුම මානසික හා මනෝ වෛද්‍ය වෘත්තිකයන්ට මාර්ගෝපදේශ නිකුත් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව කටයුතු කිරීම.

Women and Media Collective
Established 1984


## Women and Media Collective

56/1, Sarasavi Lane, Castle Street,
Colombo 08, Sri Lanka.
Email: wmcsrilanka@womenandmedia.org
Web: womenandmedia.org
Facebook: https://www.facebook.com/womenandmediacollective
Twitter: https://twitter.com/womenandmedia